# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2302/09 - 2022 ඔක්තෝබර් මස 18 වැනි අඟහරුවාදා - 2022.10.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: නුඑ/3/1/8/අත්පත්/180.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/4/2018/එල්ඕ/166.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කරගැනීමේ (සංශෝධන) පනතෙන් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය* :-

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළයේ සුළු කොට්ඨාසයේ, වටගොඩ වත්තේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පි.පි.නු 3469 හා 2021.10.15 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 ලෙස පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.6946ක් පමණ වන ඉඩම් කොටසේ විස්තර :

01. කැබලි අංක **01**

ඉඩමේ නම: වටගොඩ වත්ත; විස්තරය: වත්ත හා ස්ථිර ගොඩනැගිලි 16 ක් හා තාවකාලික ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 1.6946.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 09 වැනි දින පෙ.ව.10.00ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022.10.26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ඒ. ඒ. විදුර සම්පත්,**
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2022 ඔක්තෝබර් මස 06 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10-0159

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : HRP/LND/ACQSN/12/05.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/9/2014/අයිආර්/348ඡ්.

අංක 2081/35 හා 2018.07.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ ප්‍රකාශයෙහි ඉඩමේ විස්තරයෙහි 2A පිටුවෙහි සිංහල භාෂාවෙන් පළකරන ලද දැන්වීමෙහි කැබලි අංක 18 හි ඉඩමේ ප්‍රමාණය "හෙක්ටයාර් 0.7372" යන්න **"හෙක්ටයාර් 0.2278" ලෙස නිවැරදි විය යුතු** බව මෙයින් ප්‍රකාශ කරමි.

**එම්.කේ.ජී. මොරවක,**
ප්‍රාදේශීය ලේකම්,
හොරොව්පොතාන.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10-0160

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.